ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය

පේරාදෙණිය මණ්ඩපය

# " ශ්‍රී ලංකාවේ පූර්ව – පාසල් අධ්‍යාපනය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් "

අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සඳහා

ඉදිරිපත් කෙරුණු නිබන්ධනය

PERMANENT REFERENCE

FOR USE IN THE LIBRARY ONLY

1975 අප්‍රේල්

එච්. කේ. මුනගමගේ මෙනෙවිය.

321142

# නිබන්ධන සංක්ෂේපය

පූර්ව පාසල් වියේ පසුවන ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපැයීමේ අවශ්‍යතාව මෙරට අධ්‍යාපනඥයන්ට අවබෝධ වී බොහෝ කලක් ගත වී ඇත ද, මේ වනතෙක් එය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොමැත. ඒ හේතුවෙන් පූර්ව – පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය බොහෝ කලක් තිස්සේ නොසලකා හැර තිබූ තත්ත්වයකට පත් වී ඇත. එහෙත්, තව දුරටත් මෙසේ නොසලකා හැර තිබීම අසිරුවන පරිදි පූර්ව – පාසල් වියේ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපැයිය යුතුය යන ඉල්ලීම රටෙහි නන් දෙසින්, නන් තරාතිරමේ අය වෙතින් කාලයක් තිස්සේ ඉදිරිපත් වෙමින් පවතී. මෙසේ නැඟුණු ඉල්ලීමට කන් යොමුකළ කිසියම් ආයතන, සංවිධාන සහ පුද්ගලයන් පිරිසක් විසින් පූර්ව – පාසල් වියේ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපැයීමේ ලා ඉදිරිපත් වී සිටින බැව් පැහැදිළි ය.

ළමයකු ගේ ඉගෙනීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ ප්‍රාථමික අධ්‍යාපන අවධියට පිවිසීමට බොහෝ කලකට පෙර සිට බැව් දැන් හෙළි වී ඇති හෙයින් ළමයා ගේ පෙර – පාසල් අවධිය කෙරෙහි ද සැලැකිලිමත් වීම අවශ්‍ය තත්ත්වයක් බවට පත්ව ඇත. පෙර – පාසල් වියෙහි පසුවන්නන් සඳහා අධ්‍යාපනය සපයතැයි කියනු ලබන ආයතන එනම්, පූර්ව – පාසල් ආයතන පයෙෂ්ෂණයට භාජනය විය යුතු මේ හෙයිනි.

දිවයිනේ නගර, උපනගර, ගම්, නියම් ගම් යන සැමෙකකම විසිරී පැතිරී ඇති පූර්ව – පාසල් ආයතන සියල්ලම පයෙෂ්ෂණයට භාජනය කිරීමේ ලා අවශ්‍ය වත් පොහොසත්කම් නොමැති වූයෙන්, රටෙහි සාමාජයීය හා සංස්කෘතික තත්ත්වයන් මනාව නියෝජනය කෙරෙන පෙදෙසක් තෝරා, එය සාම්පලය ලෙස සලකා මෙම අධ්‍යයනය කර ඇත. සාම්පල් පෙදෙසෙහි වන සියලු පූර්ව – පාසල් ආයතන ගවේෂණයට භාජන කරනු ලැබූ අතර, ගවේෂණය බොහෝ සෙයින් විස්තරාත්මක ස්වරූපයක් ගත් බැව් කිව යුතු ය.

නිරීක්ෂණය, පරීක්ෂණ, ප්‍රශ්නාවලී භාවිතය හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම යන ක්‍රම මෙම අධ්‍යයනයෙහි දී කරුණු සපයා ගැනීම සඳහා භාවිතයට ගැනිණි.

"මෙරට පූර්ව – පාසල් අධ්‍යාපන සේවාව ළදරු අධ්‍යාපන මූල ධර්මවලට පටහැනිව, ඉතාමත් අසංවිධිත ආකාරයෙන් පවත්වා ගෙන යන්නකිය" යනුවෙන් මෙයට පෙර ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ කරුණු විමසූ කමිටුවක් විසින් පැමිණි නිගමනය සනාථ කෙරෙන සාක්ෂි මෙහිදී ද හමු වූ බැව් කිව යුතු ය. එහෙත් ඒ අතරම, පූර්ව – පාසල් අධ්‍යාපනය නියම මගට පිවිසීමේ ලකුණු හෙළි කෙරෙන සාධක ද කලාතුරෙකින් දක්නට ලැබිණි. කෙසේ වුවත්, පූර්ව – පාසල් අධ්‍යාපනය ගතයුතු මග හා ඒ මග යොමු කිරීම සඳහා ගත යුතු පියවර ද අවසන සඳහන් කොට ඇත.